# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/42 - 2022 ජූලි මස 22 වැනි සිකුරාදා - 2022.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

64(5) වන වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

පිළිගත් දේශපාලන පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂය විසින් නාමයෝජනා කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරන ලද රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස පත්ව ඇති හෙයින් ඔහු විසින් ස්වකීය මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව 9 වැනි පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස එකී දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී වගන්තිය යටතේ සුදුසුකම් ඇති එම පක්ෂයේ සාමාජිකයෙකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එම පුරප්පාඩුව පුරවනු පිණිස වජිර අබේවර්ධන මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමග කියවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඉහත කී රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයට පත්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා වජිර අබේවර්ධන මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කර නිවේදනය කරනු ලැබේ.

නිමල් ජී. පුංචිහේවා
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

එස්. බී. දිවාරත්න
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

එම්. එම්. මොහමඩ්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

කේ. පී. පී. පතිරණ
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

පී. එස්. එම්. චාල්ස්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

2022 ජූලි මස 22 වන දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දීය.


1A - G 37119 — 376 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*